# 23. සාම කුමරු ඉපදුණු ද



බෙත්ලෙහෙම් නුවර ගවලෙනක ජේසු කුමරු ඉපදුණා.
හැමෝ ම සතුටට පත්වුණා.
ජුසේතුමා සහ මරියතුමී ජේසු කුමරාව හොඳින්
රැක බලා ගත්තා.

නත්තල් ද අපටත් හරි ම සතුටුයි.
අපි හැමෝ ම පල්ලි යනවා. පූජාවට සහභාගි වෙනවා.
ගවලෙන ළඟට ගොස් ජේසු කුමරුට වඳිනවා.

අපි ගෙදර ඇවිත් අම්මාටත් තාත්තාටත් වඳිනවා.
සියලු දෙනා සමඟ නත්තලේ සතුට බෙදා ගන්නවා.

පැවරුම්

1. නත්තල් දා ඔබ කරන දේවල් කවරේදැයි ලියන්න.
2. නත්තල් දින පූජාවට ආශාවෙන් සහභාගි වන්න.
3. පන්තියක් වශයෙන් එක් වී ගවලෙනක් සාදන්න.

# 24. තුති ප්‍රශංසා වේවා !

වසරක් ගෙවුණා - දනුම වැඩි වුණා
අපි මිතුරු වුණා - සතුට වැඩි වුණා

ඇත්ත කියන්නට - කීකරු වන්නට
දුක් ඉවසන්නට - අපට හැකි වුණා

කොතරම් බාධක - ආවත් අප හට
එක පවුලක් සේ - කාලය ගෙවුණා

මේ හැම දේට ම - අපට වරම් දුන්
ත්‍රිත්ව දෙවිඳුට - අපි තුති පුදමු

පිතා පුත්‍රයා ස්ප්‍රිතු සාන්තු නම්
ත්‍රිත්ව ඒක දේවෝත්තමයාණන්ට
ස්තුති ප්‍රශංසා වේවා !
ආදි වූවාක් මෙන් දැනුත්
නිති පතාත් අනන්ත කාලයෙහිත් වේවා !
ආමෙන්

# පොදු යාච්ඤා

1. පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ආමෙන්.

2. **දේවදූත මංගලම්**

නමෝ මරියනි, ප්‍රිය ප්‍රසාද පූර්ණ වන්තියනි, ස්වාමින් ඔබ කෙරෙහි ය. ස්ත්‍රීන් අතුරෙන් ආශිර්වාද ලද්දී ඔබ වහන්සේ ය. ඔබගේ ශ්‍රී කුසයෙහි ඵලවන් ජේසුස් ආශිර්වාද ලද්දනුමය.

සාන්ත මරියනි, දේව මෑණියනි, පාපි වූ අප උදෙසා දැනුත්, අපේ මරණ වෙලේහිත් යාච්ඤා කළ මැනව. ආමෙන්.

3. **ස්වාමිවාක් ආරාධනාව**

ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා.! ඔබගේ රාජ්‍යය පැමිණේවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද ඉටු වේවා. අපගේ එදිනෙද භෝජනය අද අපට දනය කළ මැනව. අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව. පාප අවස්ථාවනට අසුවීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව. ආමෙන්.

4. **ත්‍රිත්ව ස්තෝත්‍රය**

පිතා, පුත්‍රයා, ස්ප්‍රිතු සාන්තු නම් ත්‍රිත්ව ඒක දේවෝත්තමයාණන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

ආදි වූවාක් මෙන් දැනුත් නිතිපතාත් අනන්ත කාලයෙහිත් වේවා.! ආමෙන්.

5. **රැකවල් දේවදූතයාට යාච්ඤාව**

මාගේ රැකවල් දේව දූතයාණෙනි, ඔබ බාරේ ඉන්නාවූ, මට අද දින (අද රෑ) ඔබගේ පරම දයාබර කමින් ඥාන එළිය දී මා ආරක්ෂා කර නඩත්තු කොට ආණ්ඩු කරනවා සොදේ.

6. **ස්ප්‍රිතු සාන්තු වහන්සේට යාච්ඤාව**

ස්ප්‍රිතු සාන්තු දෙවියනි, වැඩම කර ඔබගේ විශ්වාසීන්ගේ හෘදයන් පිරෙවුව මැනව. ඔබගේ ප්‍රේමයේ ගින්න ඔවුන් තුළ දල්වුව මැනව.

පු. ඔබගේ ස්ප්‍රිතුව යැවුව මැනව. එවිට ඔවුහු මවනු ලබන්නෝ ය.

උ. තවද ඔබ පෘථිවියේ විශාලකම අලුත් කර වදරණ සේක.

**යාච්ඤා කරමුක**

ස්ප්‍රිතු සාන්තු ආලෝකයෙන් විශ්වාසීන්ගේ හෘදයන් පැහැදෙවුවා වූ දෙවියනි, එම ස්ප්‍රිතුවෙන් සියල්ල ගැන හරි තේරුම් ගැනීම ලබන්නටත්, එම ශුද්ධ වූ සැනසිල්ලෙන් නිතර ප්‍රීති සන්තෝෂ වෙන්නටත්, අපට සලස්වා වදාළ මැනව. ආමෙන්.

# විශ්වාස ලක්ෂණය

1. අහස පොළොව මැවූ සර්වබලධාරී
පියාවන දෙවියන් කෙරෙහි - විශ්වාස කරමි.

2. උන්වහන්සේගේ එකම පුත්‍රයාණන් වූ ජේසුස් වහන්සේ
කෙරෙහි - විශ්වාස කරමි.

3. ජේසුස් වහන්සේ ශුද්ධාත්ම වරමින් ගැබ් වැද
කන්‍යා මරියතුමියගෙන් උපන් බව - විශ්වාස කරමි.

4. උන්වහන්සේ පොන්සියෝ පිලාත් හට යටහත් වී
වද විඳ කුරුසයේ ඇණ ගැසුම් කා උකුත් වී
තැන්පත් කරන ලද බව - විශ්වාස කරමි.

5. පාතාලවලට බැස, 'තුන්වැනි ද මළවුන් කෙරෙන්
උත්ථාන කර වදළ බව - විශ්වාස කරමි.

6. ස්වර්ගයට නැගී ආදර දෙව් පියාණන්ගේ
දකුණු පස වැඩ සිටින බව - විශ්වාස කරමි.

7. එහි සිට ජීවත් වන අයටත්, මළාවූ අයටත්
නඩු විදරන්නට වඩින බව - විශ්වාස කරමි.

8. ශුද්ධාත්මයාණන් කෙරෙහි ද සාධාරණ
ශුද්ධ වූ සභාව කෙරෙහි ද - විශ්වාස කරමි.

**9. සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය ද
පාප ක්ෂමාව ද, මාංශෝත්ථානයෙහි ද අනන්ත ජීවිතය කෙරෙහි ද – විශ්වාස කරමි.
ආමෙන්.**

# භාවිතය සඳහා ගීතිකා

## 1. නමෝ මරියනි

නමෝ මරියනි // නමෝ මරියනි ප්‍රසාද පූර්ණවන්තිනි

දේව පුත්‍රයා ජේසු සාන්තු වරම්භා //
පිළිසිඳිය දෙව් බෙලෙන්
ශ්‍රී ඔබේ කුසේ

## 2. මරිය රැජිණියේ

මරිය රැජිණියේ මා දයාබර මවේ
දුබල අපට සැම ද සරණ වන මවේ

මවක ලෙසින් දරු අපගේ
අවැසිතා බලා
ඒ සැම අපට නිති ලැබ දෙන
දයාබර මවේ //

## 3. රත්තරන් මුතු මැණික්

රත්තරන් මුතු මැණික් ඔබ හට
පුද කරන්නට අත නැතේ
ආදරය හා අපේ හොඳ හිත
බාර ගනු මැන සමිඳුනේ

ළමා අපගේ ජීවිතය හා
දනුම ඉගෙනුම ඔබ අතේ
තබා අපි සැම තුරුලු වන්නෙමු
ඔබේ කරුණා හදවතේ

## 4. කමා කළ මැනේ

කමා කළ මැනේ සුරිඳුනි - කමා කළ මැනේ
අප හැම කළ වැරදිවලට - කමා කළ මැනේ

අපිමිත වූ ඔබේ පෙමට - නිගරුව පිටු පා
නොමඟට ගිය අප හට - වේනු මැන අනුකම්පා

## 5. සුරලොවේ සුරපියේ

සුරලොවේ සුර පියේ - අසනු අප යැදුම් අනේ //

1. දින දින ඔබේ නම ලොව පැම
   නැත පැතිරේවා
   ඔබ රජකම සැම දන හට
   සෙවණ ගෙනේවා

2. මට කළ වරදට අනුනට
   කමාව දෙමි මා
   මම කළ වරදට මා හට
   කමාව ලැබේවා

## 6. ශුද්ධාත්මෙනි

ශුද්ධාත්මෙනි, ශුද්ධාත්මෙනි, වඩින් ශුද්ධාත්මෙනි
ම' ජීවිතේ ආලෝකයයනි, වඩින් ශුද්ධාත්මෙනි

ඔබේ වරම් මගේ හදේ මවා ශුද්ධාත්මෙනි
ම' ජීවිතේ ආලෝකවත් කරන්න ස්වාමිනි